# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 සැප්තැම්බර්

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්, 2018 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 0.9%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය අගෝස්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.5%ක් ලෙස වාර්තා විය. තවද 2018 අප්‍රේල් මාසයෙන් පසුව වාර්තාවූ අවම උද්ධමනය 0.9% වාර්තා වූයේ 2018 සැප්තැම්බර් මාසයේදීය. සැප්තැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.92%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.80%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 සැප්තැම්බර් මාසයේ 8.6% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 6.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.6%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 අගෝස්තු මාසයේ 125.4ක් වූ දර්ශකාංකය 2018 සැප්තැම්බර් මාසයේ 124.4ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 සැප්තැම්බර් මාසයේ දර්ශකාංකය 1.0ක අඩුවීමක් එනම් 0.8ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.09%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.32%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, පොල්, අමු මිරිස්, අළුත් මාළු, අර්තාපල්, සහල්, බිත්තර, රතුළූණු, ලොකුළූණු, ඉඟුරු, සුදුළූණු සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් කෙසෙල්, පැපොල්, පාන්, සීනි, තිරිඟු පිටි, අඹ, දෙහි, බනිස් වර්ග, කුකුල් මස්, කිරිපිටි, ටින් කළ මාළු (සැමන්) සහ තේ කුඩු/කොළ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 සැප්තැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’, 'ප්‍රවාහන', 'ආපනශාලා සහ හෝටල්', ‘අධ්‍යාපන’, ‘රෙදිපිළි හා පාවහන්’, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' සහ ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද ‘විවිධ භාණ්ඩ හා සේවා’ යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා විය. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට ‘සෞඛ්‍ය', 'සන්නිවේදන' සහ විනෝදාත්මක හා සංස්කෘතික’, යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවිය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව